**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථක : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

## පුවත්පත් නිවේදනය

මාර්තු 6, 2013

# ජපන් රජයෙන් උතුරු පළාතේ අවතැන් වු ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා එක්සත් ජාතින්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) හරහා ඩොලර් මිලියන 4 ක ආධාරයක්

ජපන් රජය විසින් එක්සත් ජාතින්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) හරහා උතුරු පළාතේ අවතැන් වු ප්‍රජාවගේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා යෙන් මිලියන 345ක (දළ වශයෙන් ඩොලර් මිලියන 4 ක) ආධාරයක් ලබාදෙන ලදි. එම ගිවිසුම 2013 මාර්තු 6 වන දින ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතා සහ එක්සත් ජාතින්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) ආයතනයේ ආසියාවේ ජ්‍යේෂ්ඨ මානව ජනාවාස නිලධාරි යොෂිනොබු පුකුසාවා මහතා විසින් ජපන් තානාපති නිල නිවසේදි අත්සන් කරන ලද අතර එම උත්සවයට නැවත පදිංචි කිරිමේ අමාත්‍යාංශයේ ලේකම් ජනක සුගතදාස මහතා සහ උතරේ නැවත පදිංචි කිරිමේ සහ සංවර්ධන සහ ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ආරක්ෂක බලකායේ ලේකම් එස් බී දිවාරත්න මහතාද සහභාගි විය.

තමම ආධාර තුලින් උතුරේ මංමාවත් ජල පහසුකම් බහුකාර්ය ප්‍රජා ශාලා ප්‍රතිසංස්කරණය කිරිමත් වැසි ජල ටැංකි ඉදිකිරිමත් පෙර පාසැල් අධ්‍යාපනය වැඩි දියුණු කිරිමත් කාන්තාවන් සවිබල ගැන්විමත් ආපදා වලට මුහුණදිම සඳහා ප්‍රජාව සුදානම් කිරිමත් සිදුකරනු ඇත මේ තුලින් උතුරු පළාතේ කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්ක වල අවතැන්ව නැවත පදිංචි වු ජනතාවගෙන් 98,120 කට පමණ ප්‍රතිලාභ ලැබෙනු ඇත ජපන් රජයෙන් දුන් මෙම ආධාර යටතේ මෙම වැඩ සටහන් එක්සත් ජාතින්ගේ මානව ජනාවාස වැඩසටහන (UN-Habitat) සහ ප්‍රජා මුල සංවිධාන සංවිධාන හරහා දෙවසරක් පුරාවට ක්‍රියාත්මක කරනු ඇත.

ජපන් තානාපති නොබුහිතෝ හොබෝ මහතා පැවසුයේ ''එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ (UN-Habitat) ක්‍රියාත්මක වන ප්‍රජා දායකත්ව වැඩසටහන ත් ජපන් රජයෙන් ක්‍රියාත්මක වන මානව සුරැකීමේ වැඩ සටහනත් තුලින් අදාල ප්‍රජාවගේ ජීවන තත්වයන් යථා පත්වෙනවා පමණක් නොව උතුරු පළාත නැවතත් නගා සිටුවීම සඳහාද මහත් දායකත්වයක් එම ප්‍රජාව තුලින් ලැබෙනු ඇති බවය.''

ශ්‍රී ලංකා රජයත් ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන හරහාත්ගැටුම්කාරී තත්වයන් පැවති ප්‍රදේශ වල සංවර්ධන කටයුතු සඳහා ජපන් රජය විසින් තව දුරටත් අධාර සපයනු ඇත.

******************************************************


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථන 011-2693831 දිගු අංකය 227

ඊ මේල් : cultujpn@co.mofa.go.jp